www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මුම්බායි ජන ඝාතනය: වාර්ගික දේශපාලනයේ අවෘත අන්තය

## Mumbai atrocity: the dead end of communal politics

**2008 දෙසැම්බර් 01**

මුම්බායිහි ත්‍රස්තවාදී ජන ඝාතනයට ගොදුරු වූ සංඛ්‍යාව -- නගරයේ සංචාරකයන්, කඩහිමියන්, කම්කරුවන් සහ පදිකයන් අතරින් 170කට අහිංසකයන් සංඛ්‍යාවක් මිය ගොස් 300කට අධික සංඛ්‍යාවකට තුවාල සිදු විය -- ලොව වටා මහජනතාවන් අතර අව්‍යාජ කම්පිත හැඟීමක් ඉස්මතු කර තිබේ.

එවන් ඛේදවාචක නිකම්ම සිදු නොවේ: ඒවා දශක ගනනාවක් තිස්සේ සූදානම් කෙරෙයි. මුම්බායි ඛේදවාචකය, බ්‍රිතාන්‍ය විජිත පාලනය අවසානයේ, 1947 දී ඉන්දියානු උප-මහාද්වීපය බෙදීමේ පටන් මේ දක්වා ම එම කලාපය වෙලා ගෙන ඇති ජාතික හා වාර්ගික ආතතීන් තුලින් පැන නැගී අතර එය එම ආතතීන් උත්සන්න ද කරනු ඇත.

ඉන්දියාවේ කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත සභාග ආන්ඩුවේ ප්‍රතිචාරය පෙරදැකිය හැකි වූ ලෙසම, කිසිදු වග විභාගයකින් තොර එකක් වී ඇත. ඉන්දියානු බලධාරිහු, පලිගන්නා බවට වඩ වඩා තර්ජනාත්මක ප්‍රකාශ නිකුත් කරමින්, ප්‍රහාරය සම්බන්ධයෙන් ඉන්දියාවේ ඓතිහාසික පරම-ප්‍රතිවාදියා වන පකිස්ථානයට දොස් නැගීමට හදිසි වී තිබේ.

තුවක්කුකරුවන් දස දෙනෙක් දින තුනක් තිස්සේ ඉන්දියාවේ විශාලතම නගරය යුද කලාපයක් බවට පත් කලේ කෙසේද හා මක් නිසාද යන වග සම්බන්ධයෙන් කිසිදු බැරෑරුම් පරීක්ෂනයක් සිදු කෙරී නැත. මැත සති ගනනාව තුල දී "ඉන්දියාවේ ඔත්තු සේවා" එලඹෙන ප්‍රහාරයක් පිලිබඳ "නිශ්චිත අනතුරු ඇඟවීම් අඩු ගනනේ තුනක් වත්" සිදු කර ඇති බව හින්දු පුවත්පත සඳහන් කලේ, යටත් පිරිසෙයින් ගත් කල ඉන්දියාවේ ආරක්ෂක හමුදාවල පාර්ශ්වයෙන් දැවැන්ත අසාර්ථකත්වයක් පිලිබඳව යෝජනා කරමිනි.

"ඉන්දියාවේ ඔත්තු සේවා යුද තත්වයකට ඉහල දැමෙනු ඇත" යයි ස්වදේශ කටයුතු පිලිබඳ රාජ්‍ය ඇමති ශ්‍රිප්‍රකාශ් ජයාස්වෙල් පැවසීය. ඉන්දියාව පකිස්ථානයට එරෙහිව හමුදා සේනංක බලමුලු ගන්වන බවට පල වූ වාර්තා ප්‍රතික්ෂේප කරමින් ඉරිදා නිවේදන නිකුත් කිරීමට ඉන්දියානු හමුදා ප්‍රකාශකයකුට සිදු විය.

පකිස්ථානයේ යම් පුද්ගලයන් හෝ කන්ඩායම් ප්‍රහාරවලට සම්බන්ධ බවට ඔප්පු වුව හොත් තමන් ඔවුන්ට විරුද්ධව පියවර ගන්නා බවට පකිස්ථානයේ ජනාධිපති අසිෆ් අලි සර්දාරි සෙනසුරාදා පොරොන්දු වූවාට පසුව පෙනී යන්නේ, පකිස්ථානයේ ඔත්තු සේවා හා ඒවාට සම්බන්ධිත බලවේග ජන ඝාතනය තුල කුමන ක්‍රියාකලාපයක් ඉටු කලේද යන වග සමබන්ධයෙන් සර්දාරිට ම එතරම් විශ්වාසයක් නැති බවය.

ඉන්දියානු ප්‍රහාරයකට මුහුන දෙනු වස් පකිස්ථානයේ සන්නද්ධ හමුදා සූදානම් කිරීම ගැන සාකච්ඡා කරනු වස් සෙනසුරාදා රාත්‍රියේ සර්දාරි සිය අගමැති සහ සන්නද්ධ හමුදා ප්‍රධානින් මුනගැසුනු බව ද වාර්තා විය.

ත්‍රස්තවාදය සම්බන්ධයෙන් "මෘදු" ආකල්පයක් අනුගමනය කරන බවට දිගු කලක් තිස්සේ ආන්ඩුවට චෝදනා කර සහ ඉන්දියාවේ ආරක්ෂක හමුදාවන්ට නව පුලුල් බලතල ලබා දිය යුතු බව ඉල්ලා ඇති, නිල විපාර්ශ්වය වන භාරතීය ජනතා පක්ෂය (බීජේපී) සමග පොදු පිලිවෙතක් වර්ධනය කරගනු වස්, ඒ අතරතුර, ඉන්දියානු අගැමති මන්මෝහන් සිං ඉක්මන් වී තිබේ. නව ෆෙඩරල් ත්‍රස්ත විරෝධී ඒජන්සියක් ද ත්‍රස්තවාදයට එරෙහිව සටන් වදිනු පිනිස "නව නෛතික රාමුවක්" ද නිර්මානය කරනු වස් තමන් අන්තර්-පාක්ෂික සාකච්ඡා ආරම්භ කර ඇතැයි සිං සෙනසුරාදා නිවේදනය කලේය.

හින්දු අධිපතිවාදී පක්ෂයක් වන බීජේපීයට, ඉන්දියාවේ මුස්ලිම්වරුන්ට හා සෙසු ආගමික සුලුතරයන්ට එරෙහිව ප්‍රචන්ඩත්වය සහ විවෘත ජන ඝාතන ඇවිලවීම සම්බන්ධයෙන් දිගු වාර්තාවක් ඇත. පසුගිය සතියේ මුම්බායි වෙත එල්ල වූ කොමාන්ඩෝ ප්‍රහාරයට පෙරාතු සති කිහිපය තුල, බීජේපීය සහ එහි සගයෝ, පුලුල්ව පැතිරුනු ජීවිත විනාශයන්ට තුඩු දුන් ත්‍රස්ත බෝම්බ ප්‍රහාර මාලාවක් සිදු කල හින්දු අන්තවාදීන් ආරක්ෂා කරනු වස් දෘඩතර උද්ඝෝෂනයක් ගෙන යමින් සිටියහ.

වොෂිංටනය, ඒ අතරතුර, ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ එය ගෙන යන කොල්ලකාරී යුද්ධත් රට තුල ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි එහි දැවැන්ත ප්‍රහාරයත් යුක්තියුක්ත කිරීමට යොදා ගැනෙන ආදර්ශ පාඨයක් වන, "ත්‍රස්ත විරෝධී යුද්ධය" සඳහා යුක්තිකරනයක් සම්පාදනය කර ගැනීමට මුම්බායි ජන ඝාතනය පිලිබඳ මහජන වෛරය ගසාකමින් සිටී. ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑමට එරෙහිව පකිස්ථානයේ දේශසීමා කලාප තුල ක්‍රියාත්මක

වන සන්නද්ධ විරුද්ධත්වය මර්දනය කරනු වස් තව වැඩි දුර පියවර ගන්නා ලෙස ඉස්ලාමාබාද් පාලනයට බල කිරීමට ද පකිස්ථානය තුල මිලිටරි ක්‍රියාකාරකම් සිදු කිරීමේ එක්සත් ජනපද "අයිතිය" ප්‍රහාරාත්මක ලෙස තහවුරු කර ගැනීමට ද වොෂිංටනය ඉන්දියාව හා පකිස්ථානය අතර අලුතෙන් පැන නැග ඇති ආතතීන් තිරයට පිටුපස සිට යොදා ගන්නා බවට සැකයක් නැත.

මෙම සිද්ධීන් යලිත් අවධාරනය කරන්නේ ලෝක දේශපාලනයේ පවත්නා දහනශීලී ස්වභාවයයි. අනපේක්ෂිත සිදුවීමක්, පෘථිවි ගෝලය සම්බන්ධයෙන් විභව වසයෙන් මිනිය නොහැකි ප්‍රතිවිපාක පිලිබඳ තර්ජනය මතු කරන දේශපාලන අර්බුදයක් නිර්මානය කරයි. ධනපති මාධ්‍ය, ඒවායේ හැඟීම් අවුලුවාලන හා පන්ති-ගාමක වාර්තාකරනය සමග, මෙතරම් හදිසි ලෙස හා අහඹු ලෙස පෙනී යන සිද්ධීන් සමුදායක් පිලිබඳ බැරෑරුම් පැහැදිලි කිරීමක් සඳහා කිසිදු ප්‍රයත්නයක් නොදරනු ඇත.

බටහිර මාධ්‍ය මෑත වසරවල දී ඉන්දියාව වර්නනා කලේ ශක්ති සම්පන්න ව්‍යවසායික ප්‍රභුවකට වාසභූමිය වන" ලෝකයේ වැඩිම ජනගහනයක් සහිත ප්‍රජාතන්ත්‍රය " ලෙසය, කොටින් කියතොත්, ධනවාදයේ සාර්ථකත්වය පිලිබඳ නිදසුනක් ලෙසය.

යථාර්ථය නම් දකුනු ආසියාව දැවැන්ත සමාජ ප්‍රතිසතිතාවන්ගෙන් බිඳවැටී ඇති බවයි. මෙම ප්‍රතිසතිතතා මුලබැස ඇත්තේ, ඉන්දියානු උප-මහාද්වීපයේ විජිතවාදී පාලනය ද 20 වන සියවසේ ප්‍රථම භාගයේ දී උප-මහාද්වීපය සොලවාලූ අධිරාජ්‍ය විරෝධී හා සමාජ විමුක්ති මහජන ව්‍යාපාරය අංකුර ඉන්දියානු හා පකිස්ථානු ධනේශ්වරයන් විසින් පාවාදෙනු ලැබීම සහ ඒවා මඩිනු ලැබීම ද තුල ය.

බ්‍රිතාන්‍ය ඉන්දියාව මුස්ලිම් පකිස්ථානයක් සහ හින්දු අධිපති භාවයකින් යුක්ත ඉන්දියාවක් බවට බෙදීමෙහි ප්‍රතිඵලය වූයේ මිලියන දෙකක ජනතාවකගේ ජීවිත බිලිගත් සහ පකිස්ථානය හා ඉන්දියාව අතර දෙපසට ම මිලියන 14ක ජනතාවක් සංක්‍රමනය වීම සිදු වූ වාර්ගික ප්‍රචන්ඩත්වයකි. එය තුන් වරක් විවෘත යුද්ධ බවට පිපිරුනු, රුදුරු භූ-දේශපාලනික ප්‍රතිවාදිත්වයක් ඉන්දියාව හා පකිස්ථානය අතර පැන නැගීමට තුඩු දුනි.

බෙදීම ම, අධිරාජ්‍යවාදය මත ඔවුන්ට පවතින පරාධීනත්වය ද අලුත් එහෙත් වඩ වඩා සටන්කාමී වෙමින් සිටි කම්කරු පන්තිය සම්බන්ධයෙන් පැවති භීතිය ද හේතු කොටගෙන, නැග එන දකුනු ආසියානු ධනේශ්වරයට, ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ කර්තව්‍යයන් -- උප-මහාද්වීපයේ වෙසෙන විවිධ ජනවර්ගයන්ට අයත් ජනතාවන් ඒකාබද්ධ කිරීම, ඉඩම්හිමි ආධිපත්‍යය තුරන් කිරීම සහ කුල පීඩනය අහෝසි කිරීම -- සම්පූර්න කිරීමෙහි ලා පැවති ඓන්ද්‍රීය නොහැකියාව පිලිබඳ වඩාත්ම ලේවැකි හා බේදනීය ප්‍රකාශනය වූවා පමනි.

දැන් ස්වාධීනත්වයෙන් වසර 61කට පසුව, දකුනු ආසියාව ලෝකයේ දුගී ජනතාව විශාල වසයෙන් ම ඒකරාශී වී සිටින කලාපයයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආඥාවන්ට අනුව, පකිස්ථානය මේ අවස්ථාවේ, සමාජ වියදම් කප්පාදු කරමින්, බල ශක්ති මිල සහනාධාර අහෝසි කරමින් හා පොලී අනුපාතික ඉහල දමමින්, මෘග ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලක් ක්‍රියාවට දමමින් සිටී. ඉන්දියාව තුල, ධනේශ්වරය, ලෝක ධනවාදය සඳහා ලාභ ශ්‍රම නිෂ්පාදනය සම්පාදනය කිරීම මගින් තමන්ගේ ම මඩි තරකර ගන්නා" සංවර්ධන මූලෝපායක්" අනුගමනය කරනු පිනිස, ජනගහනයෙන් බහුතරයක් සිය ජීවනෝපාය සඳහා රදා පවතින කෘෂිකාර්මික අංශයට, රාජ්‍ය සහයෝගය අහිමි කර තිබේ.

අධිරාජ්‍යවාදය විසින් සිය වාසිය පිනිස විවිධ උපාමාරු සඳහා යොදා ගනු ලබන, භූ-දේශපාලන ප්‍රතිවාදිත්වයෙහි ප්‍රතිඵලය ලෙස, බිලියන ගනන් ධන සම්පත් යුද්ධය හා අවි ආයුධ වෙනුවෙන් නාස්ති කරනු ලැබ, ආර්ථික සංවර්ධනය ද අඩාල කෙරී තිබේ. අද දකුනු ආසියාව යනු ලෝකයේ අඩුවෙන්ම ආර්ථිකව ඒකාග්‍රිත කලාපයයි.

මහජනතාවන්ගේ ගැටලුවලට ප්‍රගතිශීලී විසඳුම් සම්පාදනය කිරීමට අපොහොසත්ව, ඉන්දියානු හා පකිස්ථාන ධනේශ්වරයේ අදාල කඳවුරු," බාහිර සතුරාට " එරෙහිව මහජන වෛරය ඇවිලවීම ද කුල, ජනවාර්ගික හා ආගමික නිකායවාදී දේශපාලනය ප්‍රවර්ධනය කිරීම ද මගින් සමාජ ආතතීන් අපසරනය කිරීමට උත්සාහ කර තිබේ.

පකිස්ථානය තුල, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මෙම ක්‍රියාදාමය තුල සෘජු ක්‍රියාකලාපයක් ඉටු කලේ, පකිස්ථානයට අවි සපයමින් සහ එහි අනුප්‍රාප්තික මිලිටරි ආඥාදායකත්වයන්ට දිරි දෙමිනි -- විශේෂයෙන් ම, එය පකිස්ථානය සිය කලාපීය ඒජන්තයකු ලෙස යොදගෙන මැදිහත් වූ 1979 ඇෆ්ඝනිස්ථානයේ සෝවියට් ආක්‍රමනය ඇවිලවීමෙන් පසුව ය.

ස්වාධීන ඉන්දියාවේ ප්‍රථම දශක තුන තුල දී වාටියට සීමා වුනු බලවේගයක් වූ හින්දු දක්ෂිනාංශය, අද, බීජේපීයේ රූපාකාරයෙන්, ඉන්දියානු ධනේශ්වරයේ විකල්ප පාලක පක්ෂය බවට පත්ව ඇත. මුම්බායිහි සිද්ධීන් මගින් යලිත් වරක් එතරම් ම විචිත්‍ර ලෙස පෙන්නුම් කෙරෙන පරිදි, කොංග්‍රස් පක්ෂය මෙම ප්‍රතිගාමී ස්ථරයට අනුගත වේ, එය සමග අවෘතව සහයෝගී වේ.

මුම්බායි බේදවාචකය, අවසාන වසයෙන් ගත් කල, ධනේශ්වර ජාතිකවාදයට ව්‍යසනකාරී අධිචෝදනයක් එල්ල කරයි. ධනේශ්වර ජාතිකවාදය පන්ති

ආයාචනයන්ට දක්වන විරුද්ධත්වය, දකුනු ආසියාවේ ජනවාර්ගික, වාර්ගික හා කුල ප්‍රතිසතිතතා ජයගැනීමෙහි ලා එය දක්වන නොහැකියාවට හේතු වී තිබේ. ඒ වෙනුවට, දකුනු ආසියාවේ ප්‍රතිගාමී රාජ්‍ය පද්ධතිය. ඉන්දු උප-මහාද්වීපයේ කම්කරුවන් භේද කරමින් හා ඔවුන් එකිනෙකාට එරෙහිව අවුලවමින්, දැන් න්‍යෂ්ටික අවිවලින් සන්නද්ධ වී සිටින කලාපයක් තුල තව යුද ගිනිමැල ඇවිලවීමේ තර්ජනය මතු කරයි. දකුනු ආසියාවේ මහජනතාව ඒකාබද්ධ කරන සමාජවාදී විප්ලවයකින් මෙපිට කිසිදු කල් පවත්නා විසඳුමක් මෙම අවෘත අන්තය පිලිනොගනු ඇත.

**කීත් ජෝන්ස්**

© www.wsws.org